ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය සඳහා ලියාපදිංචි කිරීම - 2027

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව සඳහා 2027 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වීමට සුදුසුකම් ඇති අයැදුම්කරුවන්ගෙන් 2026.11.30 දින දක්වා අයැදුම්පත් භාර ගනු ලැබේ.

අයැදුම්පත පිරවීමට ප්‍රථම මෙම විස්තර පත්‍රිකාව කියවන්න

01 .i. පහත සඳහන් අඩුපාඩු සහිත ඇයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් තම අයැදුම්පත සම්පූර්ණ කර එය තැපැල් කිරීමට පෙර නිසි ලෙස සම්පූර්ණ කර තිබේ ද යන්නත්, අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා ඇත් ද යන්නත් පරීක්ෂා කර බැලීම අයදුම්කරුගේ වගකීම වේ.

1. අයැදුම්පතේ දිනය හා අත්සන නොමැති වීම
2. අයැදුම්පත හා අදාළ සහතික පත්‍ර සහතික කර නොමැති වීම
3. ඡායා පිටපත් කර හෝ තමා විසින් ම සකස් කර ගන්නා ලද අයැදුම්පත් භාවිත කිරීම
4. තෝරා ගන්නා ලද විෂයයන් සඳහන් නොකිරීම,
5. අයැදුම්පත් ගාස්තු ගෙවන ලද රිසිට්පත නොමැති වීම

ii. අයැදුම්පතේ විමසා තිබෙන සියලු ම තොරතුරු ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් කිරීමට කිසිවක් නොවේ නම් "අදාළ නොවේ" යනුවෙන් හෝ "නැත" යනුවෙන් හෝ සඳහන් කළ යුතු ය.

02. අයැදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර 2026.11.30 හෝ එදිනට පෙර හෝ ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය.** අයැදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "බාහිර උපාධි - 2026/2027" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අයැදුම්පත් එවිය යුතු ලිපිනය :

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සහ විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

03. ඔබ මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි කර ගනු ලබන්නේ ඔබගේ **අධ්‍යාපන සහතික පත්‍ර පරීක්ෂා කිරීමෙන් පසුව** බැවින්, අයැදුම්පත හා **සහතික කරන ලද සහතික පත් එවීම අනිවාර්ය බව** සලකන්න.

04. අසම්පූර්ණ හා අවසන් දිනයට (2026.11.30) පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. **අධ්‍යයන පීඨය**

උපාධි පාඨමාලාව සඳහා අපේක්ෂකයකු ලියාපදිංචි කරගනු ලබන විෂයය අනුව ඔහු/ඇය අයත් පීඨය තීරණය වේ. ඒ අනුව තෝරාගත් විෂයයන්ගෙන් තුනෙන් දෙකක් අයත් පීඨය ඔහු/ඇය අයත් පීඨය ලෙස සැලකේ.

ඉල්ලුම් කරන ලද විෂයය පත්‍රයක් වෙනස් කිරීමට අවශ්‍යය වන්නේ නම් අදාළ පීඨයට අයත් විෂයය පත්‍රයක් තෝරා ගත යුතු ය. විෂයය පත්‍ර වෙනස් කිරීමට අවස්ථාව ලැබෙනුයේ පාඨමාලාව ආරම්භ කර මාසයක් ඇතුළත පමණි.

06. වර්ෂාවසාන පරීක්ෂණය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකින් ම පැවැත්වෙන අතර, අයදුම්කරුවකු විසින් තෝරා ගත යුත්තේ ඉන් එක් භාෂා මාධ්‍යයක් පමණි. ලියාපදිංචි වීමෙන් පසුව භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

07. **පාඨමාලා ආකෘතිය**

ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව සඳහා මෙම විශ්වවිද්‍යාලයේ අනුමත විෂයයන් පහත පරිදි ය.

පළමු කාණ්ඩය	
ඉංග්‍රිසි භාෂා ප්‍රවීණතාව තොරතුරු තාක්ෂණය පාලි අනිවාර්ය විෂය පත්‍ර 01 පාලි අනිවාර්ය විෂය පත්‍ර 02	පළමු වසර සඳහා පමණි
බෞද්ධ දර්ශනය හෝ බෞද්ධ සංස්කෘතිය	පළමු, දෙවන හා තෙවන වසර සඳහා

දෙවන කාණ්ඩය
පුරාවිද්‍යාව
සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය
බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය
බෞද්ධ සමාජ වැඩ
පාලි
සංස්කෘත
සිංහල
දෙමළ
ඉංග්‍රිසි
ඉංග්‍රිසි ඉගැන්වීම්
ප්‍රංශ භාෂාව
කොරියන් භාෂාව
චීන භාෂාව
හින්දි භාෂාව
ජපන් භාෂාව

තෙවන කාණ්ඩය (තෙවන වසර සඳහා පමණි)
ආයතනික පුහුණුව/පර්යේෂණ ව්‍යාපෘතිය

08. **ආයතනික පුහුණුව / පර්යේෂණ ව්‍යාපෘතිය**

- ❖ වයස අවුරුදු පනහට අඩු විද්‍යාර්ථීන් තෙවන වසර තුළ දී ආයතනික පුහුණුව (පැය 300) සම්පූර්ණ කළ යුතුය.

- ❖ වයස අවුරුදු පනහට වැඩි විද්‍යාර්ථීන් තෙවන වසර තුළ දී ආයතනික පුහුණුව හෝ පර්යේෂණ ව්‍යාපෘතිය (වචන 10,000) සම්පූර්ණ කළ යුතුය

අධ්‍යාපන සුදුසුකම්

(අ) දේශීය අයැදුම්කරුවන් සඳහා

1. ඕනෑ ම විෂය ධාරාවකින් අ.පොෂ. (උසස් පෙළ) විභාගය විෂයයන් තුනක් සහිතව සමත් වීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම ලකුණු 30ක් ලබා තිබීම

හෝ

2. ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත් වීම

හෝ

3. රජයේ අනුමත දේශීය විශ්වවිද්‍යාලයක හෝ අදාළ රටෙහි රජය විසින් පිළිගෙන ඇති විදේශීය විශ්වවිද්‍යාලයක උපාධියක් හෝ ඊට සමාන යැ යි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සමාන සුදුසුකම් ලබා තිබීම

හෝ

4. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන හෝ බුද්ධධර්ම/ පාලි/ සංස්කෘත/ ඉංග්‍රිසි/ දෙමළ/ බෞද්ධ උපදේශනය/බෞද්ධ උරුම ආදී උසස් ඩිප්ලෝමා පාඨමාලාවලින් එකක් සමත් වී තිබීම

හෝ

5. දහම් සරසවිය උසස් ඩිප්ලෝමාව සමත්වීම හෝ දහම් සරසවිය ඩිප්ලෝමාව සමත් වී ඉන්පසුව දෙවසරක (02) කාලයක් දහම් පාසල් ගුරු සේවයේ කටයුතු කිරීම

හෝ

6. පාසල්/පිරිවෙන් ක්ෂේත්‍රයේ ස්ථිර පුහුණු ගුරු තනතුරෙහි වසර දෙකක (02) හෝ ඊට වැඩි කාලයක පලපුරුද්දක් ලබා තිබීම

හෝ

7. අ.පොෂ. (උසස් පෙළ) විභාගයට සමාන යැ යි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් කවර හෝ පරීක්ෂණයකින් සමත්ව තිබීම.

- **දෙමළ, ඉංග්‍රිසි හා වෙනත් භාෂා ප්‍රධාන විෂයයක් ලෙස තෝරා ගන්නා සිසුන් ඉහත සඳහන් කරන ලද සුදුසුකම්වලට අමතරව පහත සඳහන් අවශ්‍යතා එකක් හෝ සම්පූර්ණ කර තිබිය යුතුය.**

දෙමළ භාෂාව

1. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් දෙමළ භාෂාව සමත්ව තිබීම

2. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් හෝ රජයේ අනුමත වෙනත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් දෙමළ භාෂාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත් වීම

3. රජයේ අනුමත විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් දෙමළ භාෂා ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත්ව පාසල් හෝ පිරිවෙන් හෝ වෙනත් රාජ්‍ය ආයතනයක දෙමළ භාෂා ස්ථිරගුරුවරයකු, භාෂා පරිවර්තකයෙකු, භාෂා විශ්ලේෂකයෙකු හෝ සංචාරක මගපෙන්වන්නෙකු වශයෙන් වසර දෙකක (02) සේවා පලපුරුද්දක් තිබීම.

ඉංග්‍රිසි භාෂාව

1. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ඉංග්‍රිසි භාෂා විෂය සමත්ව තිබීම
2. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් හෝ රජයේ අනුමත වෙනත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් ඉංග්‍රිසි භාෂා විෂය පිළිබඳ උසස් ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත් වීම
3. රජයේ අනුමත විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් ඉංග්‍රිසි භාෂා ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත්ව පාසල් හෝ පිරිවෙන් හෝ වෙනත් රාජ්‍ය ආයතනයක ඉංග්‍රිසි භාෂා ස්ථිර ගුරුවරයකු, භාෂා පරිවර්තකයෙකු, භාෂා විශ්ලේෂකයෙකු හෝ සංචාරක මගපෙන්වන්නෙකු වශයෙන් වසර දෙකක (02) සේවා පලපුරුද්දක් තිබීම.

හින්දි, ජපන්, ප්‍රංශ, කොරියන් සහ චීන භාෂා

1. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අදාළ භාෂා විෂයය සමත්ව තිබීම

2. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් හෝ රජයේ අනුමත වෙනත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් අදාළ භාෂා විෂයය පිළිබඳ උසස් ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත් වීම

3. රජයේ අනුමත විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් අදාළ භාෂා විෂයය පිළිබඳ ඩිප්ලෝමා පරීක්ෂණයකින් සමත්ව පාසල් හෝ පිරිවෙන් හෝ වෙනත් රාජ්‍ය ආයතනයක අදාළ භාෂා විෂයය සම්බන්ධ ස්ථිර ගුරුවරයකු, භාෂා පරිවර්තකයෙකු, භාෂා විශ්ලේෂකයෙකු හෝ සංචාරක මගපෙන්වන්නෙකු වශයෙන් වසර දෙකක (02) සේවා පලපුරුද්දක් තිබීම.

(ආ) විදේශීය අයැදුම්කරුවන් සඳහා

1. දේශීය අයැදුම්කරුවන් සඳහා නියමිත ඉහත 01-07 දක්වා සුදුසුකම්වලින් එකක්

හෝ

2 ලන්ඩන් (උසස් පෙළ) විභාගය, පියර්සන් විභාගය හෝ මියන්මාරයේ පටමාගි (Pathamagyi) හෝ ධම්මචරිය (Dhammachariya) විභාගය සමත් තිබීම හෝ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ උසස් පෙළ විභාගය හෝ අ.පොස. (උසස් පෙළ) විභාගයට සමාන යැ යි අදාළ රටෙහි තානාපති කාර්යාලය මගින් කරනු ලබන තහවුරුව මත මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් කිසියම් සුදුසුකමක් ලබා තිබීම

සැ. යු. *සියලු ම දේශීය අයැදුම්කරුවන් පිරිවෙන් අවසාන විභාගය හෝ අ.පොස. (සාමාන්‍ය පෙළ) විභාගය සිංහල විෂයය හෝ දෙමළ විෂයය සමග සම්මාන තුනක්වත් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතු ය. අදාළ විභාග සම්මාන තුනක් සහිතව සමත් විය යුතු යැ යි ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් නොසලකන ලද කාලසීමාවේ පෙනී සිටි අපේක්ෂයකයින්ට මෙම කරුණ අදාළ නොවේ*

09. **විෂයයන් තෝරා ගැනීම හා අධ්‍යයන සම්භාර ආවරණය කිරීම**

ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව කොටස් තුනකින් යුක්ත ය.

1. ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය
2. ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය
3. ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව හදාරන සිසුන් සියලු දෙනා **බෞද්ධ දර්ශනය හෝ බෞද්ධ සංස්කෘතිය යන විෂයයන් දෙකෙන් එකක් අනිවාර්යයෙන් තෝරා ගත යුතු අතර, එම විෂයයන් දෙක ම එක් ශිෂ්‍යයෙකුට හැදෑරීමට නොහැක.**

10. **වර්ෂාවසාන පරීක්ෂණ**

වර්ෂාවසාන පරීක්ෂණ විශ්වවිද්‍යාලය මගින් සෑම වසරක ම පැවැත්වීමට කටයුතු කරන අතර, ලියාපදිංචි වී සිටින විෂයයන්ට පමණක් අදාළ පරීක්ෂණයේ දී පෙනී සිටීමට අවසර ඇත. විභාග ලියාපදිංචි කිරීම, ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් තැපැල් මගින් යවනු ලැබේ.

11. **ගාස්තු**

ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය සඳහා ගෙවිය යුතු මුදල

විස්තර හා අයදුම්පත් ගාස්තු	-	රු. 1000.00
ශිෂ්‍ය වාර්තා පොත සඳහා	-	රු. 500.00
විෂය නිර්දේශය	-	රු. 1000.00
ලියාපදිංචි ගාස්තු	-	රු. 1500.00
ශිෂ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම	-	රු. 500.00
දේශන ගාස්තු	-	රු. 20,000.00
සම්මන්ත්‍රණ ගාස්තු	-	රු. 1500.00
විභාග ගාස්තු	-	රු. 9000.00
ගෙවිය යුතු මුළු ගාස්තු	-	**රු. 35,000.00**

ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය සඳහා ගෙවිය යුතු මුදල

ලියාපදිංචි ගාස්තු	-	රු. 2000.00
දේශන ගාස්තු	-	රු. 14,000.00
සම්මන්ත්‍රණ ගාස්තු	-	රු. 1500.00
විභාග ගාස්තු	-	රු. 7500.00
ගෙවිය යුතු මුළු ගාස්තු	-	**රු. 25,000.00**

ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය සඳහා ගෙවිය යුතු මුදල

ලියාපදිංචි ගාස්තු	-	රු. 2000.00
දේශන ගාස්තු	-	රු. 14,000.00
සම්මන්ත්‍රණ ගාස්තු	-	රු. 1500.00
විභාග ගාස්තු	-	රු. 7500.00
ගෙවිය යුතු මුළු ගාස්තු	-	**රු. 25,000.00**

අමතර ගාස්තු

ශිෂ්‍ය වාර්තා පොතේ පිටපතක් සඳහා	රු. 1000.00
ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා (එක් අධ්‍යයන වර්ෂයකට)	රු. 2000.00
ශිෂ්‍ය හැඳුනුම්පතේ පිටපතක් සඳහා	රු. 500.00
අසමත් එක් විෂයය පත්‍රයක් සඳහා සම්මන්ත්‍රණ ගාස්තු	රු. 1000.00
විශ්වවිද්‍යාලය වෙත දී ඇති තොරතුරු නැවත වෙනස් කිරීම සඳහා	රු. 1000.00
ශාස්ත්‍රවේදී උපාධි I පරීක්ෂණය අසමත් විෂයය පත්‍රයක් සඳහා වි.වි.ගාස්තු	රු. 1000.00
ශාස්ත්‍රවේදී උපාධි II පරීක්ෂණය අසමත් විෂයය පත්‍රයක් සඳහා වි.වි. ගාස්තු	රු. 1200.00
ශාස්ත්‍රවේදී උපාධි III පරීක්ෂණය අසමත් විෂයය පත්‍රයක් සඳහා වි.වි.ගාස්තු	රු. 1400.00

සටහන්: මෙම ගාස්තු විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් කලින් කලට සංශෝධනය කිරීමට යටත් වේ.

❖ අයැදුම්පත් ලබාගන්නා ආකාරය

විස්තර හා අයැදුම්පත් තැපැල් මගින් ලබා ගන්නේ නම්, දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අංක **711202** දරන ගිණුමට බැර වන පරිදි **රු.1000/**ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග 10 × 8 ප්‍රමාණයේ රු. 150.00 ක මුද්දර ඇලවූ ලිපිනය ලියන ලද ලියුම් කවරයක් අයැදුම්පත් ඉල්ලීම් ලිපියක් සමග **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සහ විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07** යන ලිපිනයට 2026.11.27 දිනට පෙර එවිය යුතු ය.

අයැදුම්පත පැමිණ ලබා ගන්නේ නම්, සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා උක්ත ලිපිනයේ පිහිටි පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සහ විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ සරප් වෙත **රු.1000/ක** ගාස්තුව ගෙවා ලබා ගත හැකි ය.

සැ.යු. : අයැදුම්පත් හා විස්තර වෙබ් අඩවිය ඔස්සේ ලබා ගන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අංක **711202** දරන ගිණුමට බැර වන පරිදි **රු.1000 ක්** ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග එම අයැදුම්පත ඉදිරිපත් කළ යුතු ය.

සියලු ඉල්ලුම්කරුවන් බැංකුවට ගෙවීම් සිදු කරන ගෙවීම් පතෙහි ඔබගේ නම ඉදිරියෙන් ඔබ ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන පාඨමාලාවට අදාළ පහතින් දක්වා තිබෙන **සංකේත අංකය** යෙදීම අනිවාර්ය වේ.

පාඨමාලාව	**සංකේත අංකය**
ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි	BA

අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.11.30 වේ. එදිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයැදුම්පත් පහත ලිපිනයට යොමු කළ යුතු ය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සහ විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
නො. 214,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07

❖ *අයැදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අසම්පූර්ණ අයැදුම්පත් හා නියමිත දිනයෙන් පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.*

පාඨමාලා පිළිබඳ විමසීම්

පාඨමාලා පිළිබඳ වැඩිදුර විස්තර www.bpu.ac.lk විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් හෝ පහත අංකවලට ඇමතීමෙන් ලබා ගත හැක.

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය බැරගම සද්ධානන්ද හිමි - 071 837 2206
- ආචාර්ය ඉෂංඛ මල්සිරි මහතා - 071 423 1201
- කාර්යාලය - 011 2 580 609 / 011 2 502 944
- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - 011 2 502 942

අධ්‍යක්ෂක
විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
නො. 214, බෞද්ධාලෝක මාවත
කොළඹ 07
2026.11.01